**ශීර්ෂය 166 - නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම හා රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණය ද මුදල් අමාත්‍යවරයා වෙත පැවරි ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1) (අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂ 166 - නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 21 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් හා සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අමාත්‍යාංශයෙහි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය

| මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරු වන පරිදි සියලු මූල්‍ය කාර්යයන් සැලසුම් කළ යුතු වීම. | 1. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලසුම් නොකිරීම. | 2.4 |
| | | 2. ලේඛන හා පොත් පවත්වාගෙන නොතිබීම. | 2.9 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. කළමනාකරණ අඩුපාඩු | 2.7 (අ) |
| | | 2. අනුකූල නොවීම. | 2.10 |
| | | 3. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.11 |
| 127 (2) | එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අලුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේ දී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. කාල පමාවකින් පසු වැඩ ආරම්භ කළ ව්‍යාපෘති | 2.2.1 (අ) |
| | | 2. ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති | 2.2.1 (ආ) |
| | | 3. නගර වැඩි දියුණු කිරීම සඳහා පුළුල් සැලැස්මක් පිළියෙල කිරීම. | 2.2.1 (ඇ) |
| | | 4. අනාර්ථික ගනුදෙනු | 2.6 |
| 127 (3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාවය හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි | 1. ගර්භිත වාහන | 2.5 (අ) |
| | | 2. වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම. | 2.5 (ආ) |

| | | | |
|---|---|---|---|
| | වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියලු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 3. වෙනත් ආයතන සතු වාහන අවිධිමත්ව පරිහරණය කිරීම. | 2.5 (ඇ) |
| 127 (5) | ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව. | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපායෝජනය නොකිරීම. | 2.8.(අ)(i) |
| | | 2. පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම. | 2.8.(අ)(ii) |
| | | 3. මු.රෙ.66 මගින් සලසාගත් ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරිවීම. | 2.8.(අ)(iii) |
| | | 4. ඇස්තමේන්තු ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් වෙනත් වැය විෂයයන්ට මාරු කිරීම. | 2.8.(අ)(iv) |
| | | 5. ප්‍රතිපාදන ඌන උපයෝජනය | 2.8.(අ)(v) |
| | | 6. ක්‍රියාත්මක ජල සම්පාදන ව්‍යාපෘතිය | 2.8.(අ)(vi) |
| | | 7. රේගු ගාස්තු නිරවුල්කිරීම | 2.8.(අ)(vii) |
| | | 8. අධි ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගැනීම | 2.8.(අ)(viii) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

### 2.1 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරයන්

----------------------------------------

ප්‍රධාන කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

(i) නගර සැලසුම් හා ජල සම්පාදන විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.

(ii) විශේෂ නගර සැලසුම් හා සංවර්ධන කාර්යයන්.

(iii) නාගරික සංවර්ධන කාර්යයන් ඉටුකිරීම සඳහා ජාතික භෞතික සැලසුම් පදනම් කරගෙන සියලු ඉදිකිරීම් කටයුතු මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීම.

(iv) සෑම පුරවැසියෙකුටම පිරිසිදු පානීය ජලය ලබාදීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග ගැනීම.

(v) ජලසම්පාදන සේවා, ජලාපවහන පද්ධති සහ සනීපාරක්ෂක පහසුකම් විමර්ශනය කිරීම, සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, ඉදිකිරීම, මෙහෙයවීම හා නඩත්තු කිරීම.

(vi) ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති කාර්යක්ෂමව සහ විධිමත්ව ඉටු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(vii) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති අනෙකුත් සියළු විෂයයන් සම්බන්ධ කටයුතු කිරීම.

(viii) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සහ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ කාර්යයන් සුපරීක්ෂණය කිරීම.

**2.2 කාර්යසාධනය**

**2.2.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) කාල පමාවකින් පසු වැඩ ආරම්භකළ ව්‍යාපෘති**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අන්දරගස්යාය භූගත ජල ටැංකියේ සිට ගොන්නෝරුව දක්වා ජල නල පද්ධතිය එළීමේ දෙවන අදියර සඳහා 2015 හා 2016 වර්ෂවලදී ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා නොගැනීම නිසා පිළිවෙලින් රු.මිලියන 214.93 ක් හා රු.මිලියන 100 ක පරිපූරක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද එම ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිව් තිබුණි. සමාලෝචිත වර්ෂයේදීද මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 70 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන එයින් රු.මිලියන 12.43 ක් එනම් සියයට 18 ක් පමණක් වියදම් කර තිබුණි.

**(ආ) ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති**

(i) විදේශ මූලායන ආශ්‍රිත දේශීය පිරිවැය යන අරමුදල් සංකේතය යටතේ (සංකේත අංක 17) මහා පරිමාණ ජල සම්පාදන හා සනීපාරක්ෂාව ව්‍යාපෘතියේ ජල සම්පාදන ව්‍යාපෘති 2ක් සඳහා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 60 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) විදේශ ණය යටතේ ක්‍රියාත්මක ජල සම්පාදන ව්‍යාපෘති 21කින් ව්‍යාපෘති 5 කට අදාළව කටයුතු ආරම්භ නොකිරීම නිසා රු.මිලියන 2,920 ක් වූ ඇස්තමේන්තු ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

**(ඇ) නගර වැඩි දියුණු කිරීම සඳහා පුළුල් සැලැස්මක් පිළියෙළ කිරීම (166-2-3-33-2506)**

සමාලෝචිත වර්ෂයේදී නගර වැඩි දියුණු කිරීම සඳහා පුළුල් සැලසුමක් සකස් කිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු. මිලියන 3,355.38 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. එයින් රු. මිලියන 1,220.61ක් පමණක් වියදම් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ක්‍රියාකාරී සැලැස්ම අනුව සෑම දිස්ත්‍රික්කයකම තෝරාගත් නගරයක් ආදර්ශ නගරයක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 15ක් සඳහා පමණක් විවිධ සංවර්ධන කාර්යයන් සඳහා රු. මිලියන 2,454.44ක ප්‍රතිපාදන සලසා ගෙන ඉන් රු. මිලියන 1,211.93ක් පමණක් වියදම් කර තිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් තුළ තොරතුරු අනුව එකතුව රු. මිලියන 529.78 ක ප්‍රතිපාදන, වෙන්කර තිබුණු ව්‍යාපෘති 12 ක ප්‍රතිපාදන උපයෝජනය රු. මිලියන 156.32 ක් විය. එම ව්‍යාපෘතිවල භෞතික කාර්ය සාධනය සියයට 10 සිට සියයට 60 ක් දක්වා වූ පරාසයක විය.

**2.3 තිරසාර සංවර්ධනය**

**----------------------**

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ තිරසාර සංවර්ධනය අරමුණ ලෙස පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව සැපයීම හඳුනාගෙන තිබූ අතර සංවර්ධනය තුළින් නලජලය සැපයීම ක්‍රියාත්මක කිරීම හා මලාපවහන හා ප්‍රතීක ප්‍රතිචක්‍රීකරණය (Septage Treatment) ක්‍රියාත්මක කිරීමට ඉලක්කගත කර තිබුණි. සැමට ආරක්ෂිත පානීය ජලය හා සනීපාරක්ෂාව, දර්ශක ලෙස දක්වා තිබුණි. තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන ඇති අතර ඒ අය සඳහා වැඩසටහන් හා චක්‍රලේඛ මගින් දැනුවත් කිරීම් සිදු කර තිබුණි.

**2.4 ප්‍රසම්පාදන සැලැස්ම**

**-----------------------**

අමාත්‍යාංශය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කොට තිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්මේ අන්තර්ගත නොවූ රු. මිලියන 41.05 ක වටිනාකමක් ඇති වාහනයක් සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණි.

**2.5 වත්කම් කළමනාකරණය**

**---------------------------**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) ගර්හිත වාහන**

**----------------**

අමාත්‍යාංශ භූමියේ පරිහරණයට ගත නොහැකි වාහන 07ක් හා යතුරුපැදි 04 ක් ගාල්කර තිබුණි.

**(ආ) වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

**-------------------------------------------**

අමාත්‍යාංශ වාහන ලැයිස්තුවේ ඇතුළත් එහෙත් වෙනත් රාජ්‍ය ආයතනයක් නමින් ලියාපදිංචි කරන ලද මෝටර් රථයක් අමාත්‍යාංශය විසින් රක්ෂණය කර අදාල රක්ෂණ ගාස්තු ලෙස රු. 33,337 ක් ගෙවා ඇතත් අමාත්‍යාංශයේ වාහන පැමිණීමේ හා පිටවීමේ ලේඛන අනුව එම වාහනය 2017 ජනවාරි 10 දින සිට 2017 ඔක්තෝම්බර් 26 දින දක්වා වූ කාලය තුළ කිසිදු දිනයක අමාත්‍යාංශයට පැමිණ හෝ පිටවී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) **වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන පරිහරණය කිරීම**

අමාත්‍යාංශය විසින් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාහන 3 ක් හා වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන 17ක් ඇතුළත්ව වාහන 20ක් නිසි පරිදි පවරා ගැනීමකින් තොරව පරිහරණය කර තිබුණි.

## 2.6 අනාර්ථික ගනුදෙනු

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජල සැපයුම් හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ කාර්යයන්ට සම්බන්ධ නොවන නිලධාරීන් 10 ක් ඉන්දුනීසියාවේ පැවති වැඩසටහනකට සහභාගිවී ඇති අතර එම නිලධාරීන් වෙනුවෙන් රු. මිලියන 6.13 ක් වියදම් කර තිබුණි.

## 2.7 කළමනාකරණ දුර්වලතා

මුන්නේශ්වරම් ජල සම්පාදන කාර්යාලය ඉදිරිපස පිහිටි ඉඩම් කොටස ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 38 (අ) අතුරු විධාන යටතේ 2013 ජුනි 21 දින අත්පත් කරගෙන තිබූ අතර හලාවත ප්‍රාදේශිය ලේකම්ගේ 2014 නොවැම්බර් 16 දිනැති ලිපියෙන් එම ඉඩම රු.මිලියන 9.85 ට තක්සේරු කර තිබුණි. ඒ අනුව නියමිත වන්දි මුදල ලබාදෙන ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට දන්වා තිබුණි. එය නියමිත පරිදි සිදුකිරිමට මණ්ඩලය අපොහොසත්වීම හේතුවෙන් තක්සේරු වටිනාකමට අදාළ පොලිය ලෙස රු. 2,623,406 ක් 2017 අප්‍රේල් 11 දින මුදා හැර තිබුණි. ඒ අනුව අදාළ වන්දි මුදල කඩිනමින් ගෙවීමට අපොහොසත් වීම මත මෙසේ අතිරේක පිරිවැයක් දැරීමට සිදුව තිබුණි.

## 2.8 කාර්යභාරයන් ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම

(අ) **විසර්ජන ගිණුම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වු වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන | උපයෝජනය රු.මිලියන | ඉතිරිය රු.මිලියන | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| 2013 | පුනරාවර්තන | 187.7 | 187.1 | 0.6 | 0.3 |
| | මූලධන | 34,771.0 | 25,888.6 | 8,882.4 | 25.5 |
| | **එකතුව** | **34,958.7** | **26,075.7** | **8,883.0** | **25.4** |
| 2014 | පුනරාවර්තන | 214.8 | 210.0 | 4.8 | 2.2 |
| | මූලධන | 30,601.1 | 27,039.3 | 3,561.8 | 11.6 |
| | **එකතුව** | **30,815.9** | **27,249.3** | **3,566.6** | **11.6** |
| 2015 | පුනරාවර්තන | 213.1 | 210.9 | 2.2 | 1.0 |
| | මූලධන | 39,122.7 | 30,080.2 | 9,042.5 | 23.1 |
| | **එකතුව** | **39,335.8** | **30,291.1** | **9,044.7** | **23.0** |
| 2016 | පුනරාවර්තන | 171.2 | 167.0 | 4.2 | 2.5 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මූලධන | 34,560.2 | 26,410.2 | 8150.0 | 23.6 |
| | **එකතුව** | **34,731.4** | **26,577.2** | **8154.2** | **23.5** |
| 2017 | පුනරාවර්තන | 180.5 | 179.2 | 1.3 | 0.7 |
| | මූලධන | 33,814.1 | 26,908.2 | 6905.9 | 20.4 |
| | **එකතුව** | **33,994.6** | **27,087.4** | **6907.2** | **20.3** |

**(i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

-----------------------------------------------------

වැය විෂයයන් 03 ක හා ව්‍යාපෘති 02 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 60.48 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. 2016 වර්ෂයේදීද මෙම වැය විෂයයන් 3 න් 2 ක ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි.

**(ii) පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම මගින් සලසා ගත් ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම**

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුල රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ යාපනය සහ පුත්තලම ප්‍රදේශවල මුහුදු ජලයෙන් ලවණ ඉවත් කිරීමේ ව්‍යාපෘතිය උදෙසා රු.මිලියන 250 ක ප්‍රතිපාදන පරිපූරක ඇස්තමේන්තු මගින් වෙන් කර ගෙන තිබුණද වර්ෂය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**(iii) මුදල් රෙගුලාසි 66 මගින් සලසාගත් ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරිවීම**

------------------------------------------------------------------------

ඌව පළාතේ බණ්ඩාරවෙල ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා මු.රෙ. 66 මගින් රු.මිලියන 115 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණද වර්ෂය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**(iv) ඇස්තමේන්තු ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් වෙනත් වැය විෂයයන්ට මාරුකිරීම**

-----------------------------------------------------------------------------

වැය විෂයයන් 4 ක් සඳහා සලසා තිබු රු.මිලියන 1.8 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සම්පූර්ණයෙන් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

**(v) ප්‍රතිපාදන ඌන උපයෝජනය**

-------------------------------

වැය විෂයය 09 කට අදාළ ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 31 සිට සියයට 97 දක්වා පරාසයක් ගෙන තිබුණි. එසේම ඉන් එක් වැය විෂයයක් යටතේ වූ ව්‍යාපෘති 03කට අදාළ ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා නොගෙන සලසා ගත් පරිපූරක ප්‍රතිපාදනවල ඉතිරිය පිළිවෙලින් සියයට 64, 81 හා සියයට 97 ක් වී තිබුණි.

**(vi) ක්‍රියාත්මක ජල සම්පාදන ව්‍යාපෘති**

විදේශ ණය ගිවිසුමක් යටතේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කළ ජල සම්පාදන ව්‍යාපෘති 21 ක් සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව රු.මිලියන 15,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද ඉන් ව්‍යාපෘති 8 ක් සඳහා රු. මිලියන 6,191.45 ක් ඇස්තමේන්තු කර තිබූ අතර එම මුදල ඉක්මවා රු.මිලියන 4,099.32 ක් වියදම්කර තිබුණි.

**(vii) රේගු ගාස්තු නිරවුල් කිරීම**

මහා පරිමාණ ජල සම්පාදන හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම ව්‍යාපෘතිය (166-2-5) යටතේ ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 5 ට අදාළව 2010 හා 2012 වර්ෂවලදී ගෙවිය යුතු රු.මිලියන 927.6 ක රේගු ගාස්තු විගණනයට ඉදිරිපත් කරන ලද පෙර වර්ෂවල විසර්ජන ගිණුම්වල බැරකම් යටතේ අනාවරණය කොට නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ මුළු වියදම රු.මිලියන 1,215.06 ක් වුවද ඒ තුළ 2010 හා 2012 වර්ෂ වෙනුවෙන් නිරවුල් කළ රේගු ගාස්තුව ඇතුළත් වී තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 287.46 ක් එනම් මුළු වියදමෙන් සියයට 24 ක් පමණක් වැය කර තිබුණි.

**(viii) අධි ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා ගැනීම**

ඉඩම් අත්පත් කරගැනීමේ වැය විෂයය යටතේ ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.මිලියන 1,000 ක් වුවද ඉන් හිඟ රේගු ගාස්තු නිරවුල් කිරීමට රු.මිලියන 700 ක් ද නැගී එන ජලසම්පාදන යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා වූ ව්‍යාපෘතියකට රු.මිලියන 115 ක්ද මුදල් රෙගුලාසි 66 මගින් මාරුකර තිබුණි. ඒ අනුව මෙම වැය විෂයය යටතේ අධිප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් රු.මිලියන 815 ක් හෙවත් සියයට 81.5 ක ප්‍රතිපාදන මාරුකිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.මිලියන 185 න්ද වැය කර තිබුණේ රු.මිලියන 162.82 ක් පමණි.

## 2.9 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 891 (1) ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය සියළුම නිලධාරීන්ගේ නම් ඇතුළත් ඇප ලේඛනයක් පවත්වාගෙන යායුතු වුවද එසේ පවත්වා නොතිබුණි.

## 2.10 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීම්**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| නීති,රීති රෙගුලාසිවලට යොමුව<br>---------------------------- | වටිනාකම<br>----------<br>රු.මිලියන | අනුකූල නොවීම්<br>---------------- |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>---------------------- | | |
| (i) මුදල් රෙගුලාසි 170 (2) | 10 | ගංවතුර ආධාර වෙනුවෙන් ආයතනයකින් ලැබුණු පරිත්‍යාග රාජ්‍ය ආදායමට බැර නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන එයින් වියදම් කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | - | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් යාවත්කාලීනව ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 891 | - | ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි. |
| **(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ**<br>-------------------- | | |
| CA/1/17/1 හා 2010 මැයි 14 දිනැති ලිපියේ 3 වන වගන්තිය | - | අමාත්‍යවරයාගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන්කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 03 ක් වුවද එය ඉක්මවා තිබුණි. |

**2.11 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

------------------------------------------------------------------------------------------

(i) ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා වු 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 88 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.830,189 ක් වී තිබුණි. විස්තර පහත දැ වේ.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 19 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 02 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 80 | 51 | 29 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 41 | 34 | 07 |
| | **එකතුව** | **153** | **106** | **47** |

(ii) 2017 අගෝස්තු 29 දිනැති අංක ඩීඑම්එස්/7777/ඩබ්එස්එස්අයිපී දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය පරිදි ජල සැපයුම් හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනම මත වර්ෂ 4 ක කාලය සඳහා වැඩසටහන් නිලධාරීන් 03 ක් අනුමත කර තිබුණි. එසේ වුවද 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකු අර්ධ කාලීනව සේවයේ යොදවා තිබුණි.

**(ඈ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

**---------------------------------------------------------------------**

(i) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කළ (අංක 01/07/23 හා 2018 පෙබරවාරි 06 දිනැති ලිපියේ) තොරතුරු අනුව තනතුරු දහයකට අයත් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයින් 79 කු අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර තිබුණි.

(ii) අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කළ අංක 2/1/2015/09-1 දරන හා 2018 ජුනි 01 දිනැති ලිපිය අනුව 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයන් / නිලධාරීන් 38 දෙනෙකු පමණක් අමාත්‍යාංශයේ සේවය කරන බව වාර්තා කර තිබුණි. එම සේවකයන් / නිලධාරීන් විවිධ තනතුරු යටතේ එනම් ඉංජිනේරු සහකාර, කළමනාකරණ සහකාර, මනුසටහන්කරු, රියදුරු යනාදි වශයෙන් 1995, 2008 , 2013 සිට 2017 යනාදි වර්ෂවල සිට අමාත්‍යාංශයේ සේවය කරන බව නිරීක්ෂණය විය.

(iii) 2015 දෙසැම්බර් සිට 2017 නොවැම්බර් දක්වා වසර දෙකක කාල සීමාව තුළ එම සේවකයන් වෙනුවෙන් වැටුප් හා වේතන ලෙස රු. 82,916,013 ක මුදලක් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගෙවා තිබුණි.